# අවිජ්ජා සූත්‍රය

අංගුත්තර නිකායේ අවිජ්ජා සූත්‍රය ඇසුරින් කරන ලද පැහැදිලි කිරීමකි






**සත් පුරුෂ ආශ්‍රය**:-

සත් පුරුෂයා යනු ආර්‍ය්‍ය අෂ්ඨාංගික මාර්ගය තම ජීවිතයට සම්බන්ධ කරගෙන ජීවත් වන පුද්ගලයායි.

**සධර්ම ශ්‍රවණය**:-

හිත පිරිසිදු කරගන්නට අවශ්‍ය කරුණු කාරණා ශ්‍රවණය කිරීම සධර්ම ශ්‍රවණයයි

**ශ්‍රද්ධාව**:-

හිත පිරිසිදු කර ගැනීම සඳහා කැමැත්තක් ඕනෑකමක් ඇති කර ගැනීම(කුසලයම පවත්වා ගැනීමට ඇති කැමැත්ත) ශ්‍රද්ධාවයි

**යෝනිසෝමනසිකාරය**:-

කුසලය අකුසලය හඳුනා ගනිමින් කුසලය තුලම පවත්වන මනසිකාරයයි.

- ❖ සිතට අරමුණෙන් ඉවත් වන්නට නොදී නැවත නැවත අරමුණු ගැනීමෙහි සිත යොදවන ධර්මය මනසිකාරය නම් වේ.



**සතිසම්පජඤ්ඤය**:-

යෝනිසෝමනසිකාරය තුලින් ගොඩ නැගෙන අරමුණුවල ඇලීමෙන් හා ගැටීමෙන් තොරව සිතේ ඇති වන ගතිය සතියයි.
සම්පජඤ්ඤය යනු අරමුණු මනාව දැන ගැනීමයි

**ඉන්ද්‍රිය සංවරය** :-

ඇස, කණ,නාසය, දිව, ශරීරය සහ මන යන ඉන්ද්‍රිය හයෙන් එන අරමුණුවල ඇලීමෙන් ගැටීමෙන් තොරව සිටින්නට පුළුවන්කමයි

**ත්‍රිවිධ සුචරිතය**:-

සිත, කය, වචනය සංවරයයි

**සතර සතිපට්ඨානය**:-

කාය, වේදනා, චිත්ත, ධම්ම යන කොටස් හතර තුළම සතිය පිහිටුවා ගැනීමයි

**බොජ්ජංග හත**:-

බොජ්ජංග යනු අවබෝධයට හේතුවන අංගයි. එනම්
සතිය, ධම්ම විචය, විරිය, ප්‍රීතිය, පස්සධිය, සමාධිය සහ උපේක්ෂාවයි

**විද්‍යාව**:-

ජීවිතයේ ඇත්ත ඇති සැටියෙන් අවබෝධ වීම